Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## රියදුරු තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින "රියදුරු" තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් 2019 අගෝස්තු මස 03 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "රියදුරු" යනුවෙන් සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය)

1. වැටුප් පරිමාණය :
   2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.30,350-11 x 330/10 x 380- රු. 37,780 /- වේ. එබැවින්, තෝරාගන්නා අයදුම්කරුවන් පත්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 27,214 /= ක් වන මාසික වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 57,000.00 පමණ වේ)

2. වයස් සීමාව :
   අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 25 ට නො අඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. අධ්‍යාපන සුදුසුකම් :

   අ.පො.ස (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 6 කින් සමත්වී තිබීම.

4. වෘත්තීය සුදුසුකම් :
   බර වාහන ද ඇතුළුව සියලුම පංතිවල මෝටර් වාහන පැදවීම සඳහා බලපත්‍රයක් හිමිව සිටිය යුතු ය. වාහනවල එදිනෙදා ඇතිවන සුළු අළුත්වැඩියා කිරීම් අයදුම්කරුට කර ගත හැකි විය යුතුය. (මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම ඇති අයදුම්කරුවන්ට වැඩි සැළකිල්ල දක්වනු ලැබේ)

5. පළපුරුද්ද:
   රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක රියැදුරෙකු ලෙස අවම වශයෙන් අවුරුදු 05ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

6. බඳවා ගැනීමේ ක්‍රමය :

   ලිඛිත, ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

7. සේවා නියමයන් හා කොන්දේසි :

   (i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරු යටත් විය යුතු ය. තෝරා ගනු ලබන අයදුම්කරු මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

   (ii) තෝරා ගනු ලබන අයදුම්කරු පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මුල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

   (iii) තෝරා ගනු ලබන අයදුම්කරු, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

   (iv) තෝරා ගනු ලබන අයදුම්කරු වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

   (v) තෝරා ගනු ලබන අයදුම්කරු පත් කරනු ලැබීමට පෙර ඔහු/ඇය පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

8. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

   (අ) උප්පැන්න සහතිකය
   (ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
   (ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
   (ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික
   (ඉ) රියදුරු බලපත්‍රයේ පිටපතක්

9. රාජ්‍ය/පළාත් රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

10. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

11. අයදුම් පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

12. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නීල් ඉද්දවල,
*වැඩබලන* පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
2019 ජූලි මස 12 වැනි දින.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

*ආදර්ශ අයදුම්පත්‍රය*

*රියදුරු තනතුර*

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr/Mrs/Miss) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

03. (අ) පෞද්ගලික ලිපිනය :————.

දුරකථන අංකය : | | | | | | | | | | |

(ආ) කාර්යාලයීය ලිපිනය :————.

දුරකථන අංකය : | | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කල යුතු ලිපිනය :

පෞද්ගලික : ☐ කාර්යාලයීය : ☐

04. (අ) උපන් දිනය : වර්ෂය :———. මාසය :———. දිනය :———.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :———. මාස :———. දින :———.

05. විවාහක/ අවිවාහක බව : (විවාහක/ අවිවාහක)

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :- (ඔව්/නැත)

08. අධ්‍යාපන සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

| විභාගය | විෂයය | සාමාර්ථයන් | සමත් වූ වර්ෂය |
|---|---|---|---|
| අ.පො.ස (සා/පෙළ) | සිංහල/ දෙමළ | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

10. පළපුරුද්ද :- (සහතික පිටපත් ඇමිණිය යුතුය.)
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :
(අ) ආයතනයේ නම හා ලිපිනය :————.
(ආ) මුල් පත්වීමේ දිනය :————.
(ඇ) දැනට දරන තනතුර :————.
(ඈ) මාසික මූලික වැටුප :————.
(ඉ) දීමනා :————.
(ඊ) දළ වැටුප :————.

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :————.

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? (ඔව්/නැත)
එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :————.

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ .................. තනතුර දරන .................................. මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/ නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

————,

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)

දිනය :————.